එවැනි පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාවයේ ප්‍රමාණය අනුව සහ එවැනි ශ්‍රමිකයින් පුහුණු කිරීමට ගතවන කාලයේ දීර්ඝ කමත් ඒ සඳහා අවශ්‍ය සම්පත් වල ප්‍රමාණයත් සැලකිල්ලට ගෙන සංවර්ධන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන අවස්ථාවන්හි අවශ්‍ය ප්‍රමාණයේ පුහුණු ශ්‍රමිකයින් නොමැති කම බාධාවක් නොවීමට සහතික වන අයුරින් කටයුතු කිරීම වැදගත් වේ. විස්තරාත්මක ශ්‍රම බල සැලැස්මක් සකස් කිරීමේ කර්තව්‍යයට පදනමක් වශයෙන් පුහුණු ශ්‍රමිකයින් විදේශගත වීමේ ප්‍රශ්ණය සවිස්තර ලෙස ගණනය කිරීම හා අධ්‍යයනය කිරීම පිළිබඳව රජයේ ප්‍රමුඛතාවය ලැබිය යුතුය.

## විදේශීය වෙළෙඳාම

රේගු වාර්තා අනුව, 1977 දී ශ්‍රී ලංකාව පිට පිටම දෙවන වරටත් වෙළෙඳ තුලනයේ හෙවත් ශේෂයේ අතිරික්තයක් අත් දුටුවේය. අපනයන ඉපැයීම්, 1976 දී වූ රුපියල් දශලක්ෂ 4,815 සිට 1977 දී රුපියල් දශ ලක්ෂ 6,638 දක්වාත්, ආනයන ගෙවීම් රුපියල් දශලක්ෂ 4,645 සිට[1] රුපියල් දශලක්ෂ 6,007 දක්වාත් වැඩි විය. 1977 අතිරික්තය මීට පෙර නොවූ විරූ අතිරික්තයක් වූ අතර, එය රටේ මුළු අපනයන ඉපැයුමෙන් සියයට 10 ක් පමණ විය.

සමහර රාජ්‍ය ආයතනයන්ගේ ගණුදෙනු රේගුව ප්‍රමාදවී වාර්තා කරන නිසා, ශ්‍රී ලංකා මහ බැංකුව අතීතයේදී මෙන්ම, මෙවරත් විදේශ සමග කරන ලද වෙළෙඳ කටයුතු පිළිබඳ නිවැරදි සටහනක් ලබා ගැනිම සඳහා රේගු දත්ත රාජ්‍ය ආයතනයන්ගේ සංඛ්‍යා සමග ගලපා ඇත. පහත දක්වෙන සංඛ්‍යා සටහනෙහි දක්වෙන්නේ රේගු දත්ත සහ එසේ ගලපන ලද දත්තයන්ය.

**8 වැනි සංඛ්‍යා සටහන**

රුපියල් දශලක්ෂ

| වසර | ආනයන | | අපනයන | | වෙළෙඳ ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | රේගු සංඛ්‍යා | ගලපන ලද | රේගු සංඛ්‍යා | ගලපන ලද | රේගු සංඛ්‍යා | ගලපන ලද |
| 1974 .. | 4,554 | 4,770 | 3,472 | 3,503 | – 1,082 | – 1,267 |
| 1975 . | 5,251 | 5,196 | 3,933 | 3,969 | – 1,318 | – 1,228 |
| 1976[1] .. | 4,645 | 4,902 | 4,815 | 4,840 | + 170 | – 62 |
| 1977 .. | 6,007 | 6,061 | 6,638 | 6,570 | + 631 | + 509 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව.
ශ්‍රී ලංකා මහ බැංකුව.

ගලපන ලද දත්ත අනුව, 1976 දී රුපියල් දශලක්ෂ 170 ක් වූ රේගු වෙළෙඳ අතිරික්තය රුපියල් දශ ලක්ෂ 62 ක කුඩා හිඟයක් බවට පත් වේ. 1977 දී වෙළෙඳ අතිරික්තය රුපියල් දශලක්ෂ 509 ක් ලෙස වාර්තා වූ අතර, එය අපනයන ඉපයීම් වලින් සියයට 8 ක් විය.

1977 වැඩි දියුණු වූ වෙළෙඳ තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ පිට පිටම දෙවැනි වර්ෂය සඳහා වෙළෙඳ අනුපාතයේ ඇති වූ වැඩි දියුණු වීමයි. 1976 දී සියයට 35 ක වැඩි දියුණුවක් පෙන්වන තෙක් 1968 සිට වෙළෙඳ අනුපාතය අඛණ්ඩව පිරිහෙමින් තිබුණි. මෙයට හේතු වූයේ අපනයන මිල සියයට 20 කින් වැඩිවීමත් ආනයන මිල සියයට 12 කින් අඩුවීමත්ය. සියයට 23 ක ආනයන මිල වැඩිවීම අභිබවා ගිය සියයට 60 ක අපනයන මිල වැඩිවීම නිසා 1977 දී තවදුරටත් වෙළෙඳ අනුපාතය සියයට 31 කින් වැඩිදියුණු විය. අපනයන මිල දර්ශකයේ සියයට 80 විශාල වැඩිවීම, වෙළෙඳ අනුපාතය වැඩිදියුණු වීමට සැහෙන දුරට හේතු විය. පහත දක්වෙන 9 වැනි සංඛ්‍යා සටහන සමස්ථ තත්වයන් පිළිබඳ සාරාංශයක් සපයයි.

1. සංශෝධිත රේගු දත්ත
2. ධාන්‍ය සහ සීනි ආනයන සහ මැණික් සහ ඛනිජ නිෂ්පාදිත අපනයන සම්බන්ධයෙනි.

**9 වැනි සංඛ්‍යා සටහන**

**විදේශීය වෙළෙඳාම 1968 – 77**

| වසර | රුපියල් දශලක්ෂ | | | දර්ශක අංකය 1967=100 | | | | වෙළෙඳ අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය | | මිල | | |
| | අපනයන[1] (නැ.වි.ස.) | ආනයන (මි.ර.ගැ.) | වෙළෙඳ ශේෂය | සියලු අපනයන | සියලු ආනයන | සියලු අපනයන | සියලු ආනයන | |
| 1968 | 2,035 | 2,173 | – 138 | 103 | 101 | 117 | 126 | 93 |
| 1969 | 1,916 | 2,543 | – 627 | 98 | 103 | 117 | 134 | 88 |
| 1970 | 2,033 | 2,313 | – 280 | 102 | 102 | 118 | 140 | 84 |
| 1971 | 1,947 | 1,986 | – 39 | 99 | 90 | 117 | 150 | 78 |
| 1972 | 2,009 | 2,064 | – 55 | 97 | 88 | 118 | 157 | 75 |
| 1973 | 2,617 | 2,715 | – 98 | 98 | 79 | 137 | 209 | 65 |
| 1974 | 3,471 | 4,554 | –1,082 | 85 | 56 | 217 | 370 | 58 |
| 1975 | 3,933 | 5,251 | –1,318 | 102 | 69 | 199 | 433 | 46 |
| 1976[2] | 4,815 | 4,645 | + 170 | 97 | 75 | 239 | 383 | 62 |
| 1977 | 6,638 | 6,007 | + 631 | 89 | 97 | 382 | 471 | 81 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව;
ශ්‍රී ලංකා මහ බැංකුව.

1. ප්‍රති-අපනයන ඇතුළුව

2. ආනයන වටිනාකම සම්බන්ධයෙන් රේගුව විසින් කරණලද ගැලපීම්වලට පසුව සංශෝධනය කර ඇත.

**අපනයන**

මුළු අපනයන ඉපයීම් රුපියල් දශලක්ෂ 1,823 කින් හෙවත් සියයට 38 කින් ඉහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ 1976 දී රුපියල් දශලක්ෂ 2,100 සිට 1977 දී රුපියල් දශලක්ෂ 3,503 දක්වා සියයට 67 කින් තේ අපනයන ඉපයීම් ඉහළ යාමයි. තේ අපනයන පරිමාවේ කිලෝග්‍රෑම් දශලක්ෂ 14 ක අඩුවීමක් තිබියදී කිලෝවක සාමාන්‍ය අපනයන මිල රුපියල් 10.50 සිට රුපියල් 18.86 දක්වා 1977 දී වැඩිවිය. 1977 වර්ෂයේදී අන්තර් ජාතික තේ මිලෙහි වර්ධනය සහ වර්ෂය අග භාගයේදී රුපියලේ වටිනාකම ක්ෂයවීමත් යන කරුණු දෙකම මෙම මිල වර්ධනයට හේතු විය. රබර් අපනයන වටිනාකම රුපියල් දශලක්ෂ 41 කින් හෙවත් සියයට 5 කින් වැඩිවිය. මෙහිදී අපනයන පරිමාවේ අඩුවීම මිලෙහි ඇතිවූ වැඩිවීම මගින් පියවිනි. ප්‍රධාන වශයෙන් තියුණු ලෙස අපනයන පරිමාවේ අඩුවීම හේතුවෙන් පොල් අපනයන ඉපයීම් සියයට 12 කින් අඩුවිය. අප්‍රධාන කෘෂිකාර්මික අපනයනයන්ගේ ඉපයීම් රුපියල් දශලක්ෂ 106 ක් හෙවත් සියයට 46 කින් ඉහළ ගියේය. රේගු දත්ත අනුව සියයට 14 ක මැණික් අපනයන වැඩිවීමක් හෙලිවේ. නමුත් මැණික් සංස්ථාව දක්වන අන්දමට ප්‍රධාන වශයෙන් වෙළෙඳ පොළේ අස්ථාවරත්වය නිසා, 1977 දී සියයට 11 කින් මැණික් අපනයන පහත වැටුණි. කාර්මික අපනයන සියයට 13 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. ඛනිජ තෙල් පිරිපහදුවේ අතිරික්ත නිෂ්පාදන වල අපනයනයන් වැඩිවීම මෙයට විශේෂයෙන් හේතු විය.

සමස්ථ තත්ත්වය සහ අපනයනයන්ගේ සාපේක්ෂ පංගු පහත දැක්වෙන 10 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

**10 සංඛ්‍යා සටහන**

**අපනයන සැකැස්ම - 1975 - 77**

| | රුපියල් දශලක්ෂ | | | මුළු අපනයනයන්ගේ ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | 1975 | 1976 | 1977 | 1975 | 1976 | 1977 |
| 1· තේ .. | 1932 | 2100 | 3503 | 49 | 44 | 53 |
| 2· රබර් .. | 654 | 890 | 931 | 17 | 18 | 14 |
| 3· පොල් .. | 397 | 382 | 335 | 10 | 8 | 5 |
| 4· සුළු අපනයන භෝග* .. | 171 | 231 | 338 | 4 | 5 | 5 |
| 5· මැණික් .. | 180 | 261 | 298 | 5 | 5 | 4 |
| 6· කාර්මික අපනයනයන්*† .. | 542 | 782 | 866 | 14 | 16 | 13 |
| 7· වෙනත් අපනයන .. | 48 | 156 | 345 | 1 | 3 | 5 |
| 8· මුළු දේශීය අපනයන .. | 3923 | 2801 | 6615 | 100 | 100 | 100 |
| 9· ප්‍රති අපනයන .. | 10 | 14 | 23 | ... | ... | ... |
| මුළු එකතුව .. | 3933 | 4815 | 6638 | 100 | 100 | 100 |

* තෝරාගත් අයිතමයන් ඇතුලත්ය † ගලපන ලද දත්ත මූලය: ශ්‍රී ලංකා රේගුව.

තේ, රබර්, පොල් යන ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයනයන්ගේ මුළු පංගුව 1976 දී සියයට 70 සිට 1977 දී සියයට 72 දක්වා වැඩිවිය. මෙය පසුගිය වර්ෂ වලදී දක්නට ලැබුණු පසු බැස්මේ උපනතියෙහි වෙනසකි. කෙසේ වුවත්, මෙයින් අපනයන විවිධාංගකරණය කිරීමේ ක්‍රියාශීලිත්වයේ අඩුවීමක් දක්වන්නේ නැත. එය 1976 වර්ෂයේ ප්‍රධාන අපනයනයන්ගේ සැළකිය යුතු මිල වැඩිවීම පිළිබිඹු කිරීමකි.

**ආනයන**

පසුගිය වර්ෂ තුනේදී ආනයන සඳහා වූ වියදම් පහත දැක්වෙන 11 වැනි සංඛ්‍යා සටහනින් වර්ග කර දක්වා ඇත.

**11 සංඛ්‍යා සටහන**

**ආනයන වියදම් - 1975 - 1977**

| | රුපියල් දශලක්ෂ වලිනි | | | මුළු ආනයන වලින් ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | 1975 | 1976 | 1977 | 1975 | 1976 | 1977 |
| **1· පරිභෝජන භාණ්ඩ ..** | **2,651** | **1,689** | **2,534** | **51** | **36** | **42** |
| 1·1 ආහාර පාන .. | 2,520 | 1,491 | 2,181 | 48 | 32 | 36 |
| 1·2 රෙදිපිළි හා රෙදිපිළි ද්‍රව්‍ය .. | 20 | 49 | 150 | ... | 1 | 3 |
| 1·3 වෙනත් .. | 111 | 149 | 203 | 2 | 3 | 3 |
| **2· අන්තර් භාණ්ඩ ..** | **1,888** | **2,259** | **2,648** | **36** | **49** | **44** |
| 2·1 ඛනිජ තෙල් .. | 872 | 1,164 | 1,441 | 17 | 25 | 24 |
| 2·2 පොහොර .. | 208 | 99 | 51 | 4 | 2 | 1 |
| 2·3 රසායනික ද්‍රව්‍ය .. | 115 | 90 | 120 | 2 | 2 | 2 |
| 2·4 වෙනත් .. | 693 | 906 | 1,036 | 13 | 20 | 17 |
| **3· ආයෝජන භාණ්ඩ ..** | **653** | **641** | **746** | **12** | **14** | **12** |
| 3·1 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ .. | 322 | 364 | 286 | 6 | 8 | 5 |
| 3·2 ගමනාගමන උපකරණ .. | 116 | 175 | 232 | 2 | 4 | 4 |
| 3·3 ගොඩනැගිලි ද්‍රව්‍ය .. | 169 | 104 | 129 | 3 | 2 | 2 |
| 4· වර්ග නොකළ .. | 59 | 54 | 79 | 1 | 1 | 1 |
| 5· මුළු එකතුව .. | 5,251 | 4,645 | 6,007 | 100 | 100 | 100 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව;
ශ්‍රී ලංකා මහ බැංකුව

ඉහත සඳහන් දත්ත රේගු වාර්තා මත පදනම් වී ඇත. රජයේ හාල්, පිටි, සීනි සහ පොහොර ආනයන පිළිබඳ වාර්තා කිරීමේදී ඇති ඇතැම් පමාවන් නිසා මෙම දත්ත ඉතා ප්‍රවේශමෙන් කියවිය යුතුය. රුපියල් දශ ලක්ෂ 2,534 ක් වූ පාරිභෝගික භාණ්ඩ ආනයනයන් 1977 දී තියුණු ඉහළ යාමක් පෙන්වූ අතර, එය පංගු වශයෙන් සියයට 42 ක් විය. පරිභෝජනය සඳහා ආනයනයන් කෙරෙහි රටෙහි සැළකිය යුතු යැපීම පිළිබිඹු කරමින් මෙහි අතුරු වර්ගයක් වූ ආහාර පාන මෙහි ප්‍රධාන පංගුව වශයෙන් පැවතුනි. හාල් (රුපියල් දශ ලක්ෂ 917), පිටි (රුපියල් දශ ලක්‍ෂ 925), සහ සීනි (රුපියල් දශලක්‍ෂ 197) එකතු කොට ගත් කල, එය මුළු ආනයනයන්ගෙන් සියයට 34 කට වග කිය. වෙළෙඳ දර්ශක අනුව ආහාර පාන ආනයනයන් ආසන්න වශයෙන් දෙගුණ වීම නිසා පරිභෝජන භාණ්ඩවල ආනයන පරිමාව සියයට 45 ක වැඩිවීමක් දක්විය. එම මිල මට්ටම සියයට 16 ක වැඩිවීමක් පෙන්විය. ඛනිජ තෙල් ආනයන වල වැඩිවීමක් තිබියදී අතරමැදි භාණ්ඩවල පංගුව සියයට 49 සිට 44 දක්වා පහත වැටුණි. වෙළෙඳ දර්ශක වලට අනුව, ආනයන පරිමාව සියයට 6 කින් අඩු වූ අතර, මිල සියයට 40 කින් වැඩි විය. ආයෝජන භාණ්ඩවල පංගුව සියයට 14 සිට 12 දක්වා 1977 දී පහත වැටුණි. පරිමා දර්ශකය සියයට 16 ක වැඩිවීමක් දක්වූ අතර මිල දර්ශකය සියයට එකක පමණ සුළු වැඩිවීමක් දක්විය. සාමාන්‍යයෙන් තුන් වර්ගයේම ආනයන වටිනාකම වැඩිවීමක් පෙන්විය. මින් පරිභෝජන භාණ්ඩ වලට ප්‍රධාන පංගුව හිමිවිය.

පසුගිය වර්ෂවලදී ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් වෙළෙඳාමේ යෙදෙන රටවල සැලෙන වෙනස්කම් ඇතිවිය. 1977 දී, පකිස්ථානය ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවා විය. පකිස්ථානය ලංකාවේ අපනයනයන්ගෙන් සියයට 8 හෙවත් රුපියල් දශලක්ෂ 534 කට හිමිකම් පෑවේය. එක්සත් රාජධානිය රුපියල් දශ ලක්ෂ 533 කටත්, අමෙරිකා එක්සත් ජනපදය රුපියල් දශ ලක්ෂ..501 කටත්, මහජන චීන සමූහාණ්ඩුව රුපියල් දශ ලක්ෂ 433 කටත්, හිමිකම් පෑහ. ශ්‍රී ලංකාව ආනයනය කළේ ප්‍රධාන වශයෙන් සෞදි අරාබිය (රුපියල් දශ ලක්ෂ 742 හෙවත් සියයට 12), ඉරානය (රුපියල් දශ ලක්ෂ 586 හෙවත් සියයට 10), අමෙරිකා එක්සත් ජනපදය (රුපියල් දශ ලක්ෂ 537 හෙවත් සියයට 9), ජපානය (රුපියල් දශ ලක්ෂ 398 හෙවත් සියයට 7), ඉන්දියාව (රුපියල් දශලක්ෂ 358 හෙවත් සියයට 6) සහ එක්සත් රාජධානිය (රුපියල් දශ ලක්ෂ 327 හෙවත් සියයට 6) සමගය.

මෑතක ශ්‍රී ලංකා වෙළෙඳ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණයක් වූයේ, ද්විපාර්ශවීය ගෙවුම් ගිවිසුම් අතහැර පරිවර්ත්‍ය මුදල් මගින් ගෙවීම් කළ හැකි සාමාන්‍ය වෙළෙඳ ගිවිසුම් කරා ක්‍රමයෙන් වෙනස් වීමයි. බොහෝ කලෙක සිට ගෙවුම් ගිවිසුම් තිබූ රටවල් සමග ශ්‍රී ලංකාවට වාසිදායක ශේෂයන් තිබුණු අතර, එම ශේෂයන් යොදවා එම රටවලින් ආනයන වැඩිකර ගැනීමේ දුෂ්කරතා තිබුණි. එක්සත් අරාබි ජනරජය, සෝවියට් රුසියාව, බල්ගේරියාව, චෙකොස්ලෝවැකියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය සහ යුගෝස්ලේවියාව සමග තිබූ ගෙවුම් ගිවිසුම් දැන් සාමාන්‍ය වෙළෙඳ ගිවිසුම් බවට පරිවර්තනය කර ඇත. දැනට ඉතුරු වී ඇත්තේ මහජන චීන සමූහාණ්ඩුව සහ සිරියාව සමග ඇති ද්විපාර්ශවීය ගෙවුම් ගිවිසුම් දෙකක් සහ කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන සමූහාණ්ඩුව සමග ඇති අක්‍රියාකාරී ගිණුමක්ද පමණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම රටවල් සමග වෙළෙඳාමෙහිදී ශ්‍රී ලංකාවට ඉමහත් බුරුලක් ලැබී ඇත.

1978 අයවැය කථාවෙහි සඳහන් පරිදි දැන් ශ්‍රී ලංකාව නව වෙළෙඳ සහ ගෙවුම් ප්‍රතිපත්තියක් අනුමත කර ඇත. රුපියලේ පාවීමෙන් පසුව ආනයනය ලිහිල් කිරීම නිසා රටේ ආර්ථික වර්ධනයට අවශ්‍ය කාර්මික හා කෘෂිකාර්මික භාණ්ඩ ගෙන්වා ගැනීමට හැකි වනු ඇත. පූර්ව බලපත්‍ර අවශ්‍ය වූ ආනයනයන්ගේ සංඛ්‍යාව 1977 නොවැම්බර් සිට රජය විසින් තියුණු ලෙස අඩුකර ඇත. 1977 අංක 1 දරණ විශේෂ ආනයන බලපත්‍ර නියෝගය අනුව වෙළෙඳ ද්‍රව්‍ය 150 කට අඩු ප්‍රමාණයකට පමණක් බලපත්‍ර අවශ්‍ය වේ. ඒ අතර රුපියල් 700,000 ක් දක්වා යන්ත්‍ර උපකරණ බලපත්‍ර රහිතව ආනයනය කිරීමට අවසර දුනි. දේශීය ව්‍යවසායන් විදේශීය භාණ්ඩවල තරඟයෙන් ආරක්ෂා කිරීමත් රජයේ සහනාධාරයන් තව දුරටත් පවත්වාගෙන යාමත් යන අපේක්ෂාවන් මත නව ලිහිල් බලපත්‍ර ක්‍රමය සකස් කර ඇත. ඒ

අතර, අංක 77/2 දරණ ආදායම් ආරක්ෂණ නියෝගය අනුව අළුත්ම තීරුබදු ව්‍යුහයක් ප්‍රකාශ කෙරුණි. සියයට 5 හේ සිට සියයට 100 දක්වා දිවෙන මූලික තීරුබදු මට්ටම් 5 ක් අලුත් ව්‍යුහය විසින් හඳුන්වා දුනි. අඩුම බදු අනුපාත හෝ බද්දෙන් තොර ආනයන, දේශීයව නිෂ්පාදනය නොකරන අමු ද්‍රව්‍ය සඳහා යොද ඇති අතර, අනෙක්වා සඳහා ඉහළ බදු අනුපාත යොද ඇත. විශේෂයෙන් ගුණයෙන් දුර්වල දේශීය නිෂ්පාදිත ඇති විට ඒ හා සමාන භාණ්ඩ ඉහළ තීරුබදු අනුපාතික යටතේ ආනයන කිරීමට ඉඩ හැර ඇත. රුපියලේ ක්ෂය වීම සහ ඉහළ නැව් ගාස්තු සැලකිල්ලට ගත් කල දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම සඳහා මෙම පියවරයන් සෑහෙතියි සලකනු ලැබිය. ඇත්තෙන්ම, ආනයනයන් (ඉතා ඉහළ මිලකට) පැමිණීම දේශීය නිෂ්පාදනයන්ගේ භාණ්ඩවල ගුණය වැඩි කිරීමට සානුබලයක් වේ යයි අපේක්ෂා කරණ ලදී. ආනයන ලිහිල් කිරීම නිෂ්පාදනය ව්‍යාප්ත කිරීමට හේතු වේ යයි අපේක්ෂා කරන ලදී. වෙනත් වචනවලින් කිවහොත්, දුෂ්කරවූ ප්‍රමාණාත්මක ආනයන පාලන-යන්ගෙන් මිදී තීරුබදු ව්‍යුහය මගින් කෙරෙන සරල පාලනයකට හැරෙන උපනතියක් මෙයින් පෙන්නුම් කෙරේ.

නව තීරුබදු ව්‍යුහය අඛණ්ඩ සමාලෝචනයකට භාජන කිරීම සඳහා තීරුබදු සමාලෝචන කමිටුවක් පත් කළ අතර, ස්ථිර තීරු බදු කොමිසමක් පත් කිරීම පිළිබඳ අපේක්ෂාවක් පවති එවක් පටන් ඉහත කී කමිටුව විසින් තීරුබදු වල ඇතැම් ආන්තික වෙනස් කිරීම් කර ඇත. සුබෝපභෝගී භාණ්ඩ කීපයක් සඳහා සියයට 500 ක තීරුබදු නියම කිරීම මින් ඉතා වැදගත් කරුණකි. අපනයන අංශය දෙස බලන විට, නොවැම්බරයේදී කරන ලද විනිමය අනුපාත ඒකාංගිකරණය නිසා තේ, රබර්, පොල් යන ප්‍රධාන අපනයන භාණ්ඩ නිෂ්පාදකයන්ට අන-පේක්ෂිත ලාභ ලැබීමට ඉඩ තිබූ නිසා රජය තේ රබර් සඳහා වූ අපනයන තීරුබදු වැඩි කිරීමෙන් සහ පොල් සඳහා නව අපනයන තීරුබද්දක් දැමීමෙන් එම ලාභ ඉවත් කළේය. නමුත් මෙම ප්‍රධාන කර්මාන්තයන් සඳහා සෑහෙන දිරිගැන්වීමක් අවශ්‍ය විය හැක. ඒ නිසා ආර්ථිකයේ මෙම ප්‍රධාන අංශයන්ගේ ආර්ථික රඳා පැවැත්ම සඳහා නිරන්තරව තීරු බදු පිළිබඳ පරීක්ෂා කාරිත්වයෙන් සිටීම අවශ්‍ය විය හැක.

අපනයන නගා සිටුවීමේ අදහසින් ශ්‍රී ලංකා මහ බැංකුව 1977 ජනවාරි මාසයේදී අපනයන ඇසුරුම් ණය සහතික ක්‍රමයක් හඳුන්වා දුනි. සම්ප්‍රදායික නොවන අපනයන සම්බන්ධයෙන් බැංකු විසින් නැවගත කිරීමට ප්‍රථම දෙනු ලබන අත්තිකාරම් (ඇසුරුම් ණය) පිළිබඳ වඩාත් ලිහිල් ක්‍රියා මාර්ගයක් ගෙන යාමට වාණිජ බැංකු උනන්දු කරවීම සඳහා එම ණය මහ බැංකුව විසින් මෙම ක්‍රමය යටතේ සහතික කරනු ලැබේ. අපනයනකරු ණය නොගෙවා පැහැර හැරියහොත්, හෝ ණය ගෙවීමට ශක්තියක් නොතිබුණහොත් එමගින් බැංකුවලට වන පාඩුවෙන් තුනෙන් දෙකක් මහ බැංකුව විසින් ගෙවනු ලැබේ. මෙම ණය සහතික ක්‍රමය සියලුම අපනයන ණය සඳහා දික් කරන නව සහතික ක්‍රමයක් දැනට සකස් කරගෙන යනු ලැබේ.

## ගෙවුම් තුලනය හෙවත් ශේෂය[1]

මීට පෙර සඳහන් කළ පරිදි, 1977 දී වෙළඳ අනුපාතය සැලකිය යුතු ලෙස දියුණු වීම හේතු කොට ගෙන 1965 න් පසු ප්‍රථම වරට ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුමෙහි අතිරික්තයක් වාර්තාගත විය. ඇත්ත වශයෙන්ම, 1965 දී ඇතිවූ අතිරික්තය වුවද, 1957 සිට දිගු කලක් පැවති හිඟයන් අතර වූ එකම විශේෂය විය. 1977 දී ඇතිවූ වෙනසද එපරිද්දෙන්ම වැදගත් වේ. ජංගම ගිණුමෙහි හිඟය 1975 දී රුපියල් දශ ලක්ෂ 772 ක්වූ අතර, එය 1976 දී රුපියල් දශ ලක්ෂ 50 දක්වා අඩුවෙමින් ගෙවුම් තුලනය ශක්තිමත් ලෙස වර්ධනය විය. 1977 දී මෙම

1. ගෙවුම් තුලනයෙහි හෙවත් ශේෂයෙහි යොදගෙන ඇති වෙළඳ දත්තයන්ගෙන් දක්වෙන්නේ වර්ෂය තුල සිදුවූ ලැබීම් හා ගෙවීම්ය. මෙම දත්තයන් අපනයන සහ ආනයනයන්ගේ ද්‍රව්‍යමය චලනය නිරූපනය කරන, මීට ඉහත දක්වූ විදේශීය වෙළඳ දත්තයන්ගෙන් වෙනස් වේ. එම වෙනසට හේතුව නම්, එක් අතකින් ලැබීම් සහ ගෙවීම් ද, අනික් අතින් භාණ්ඩයන්ගේ ද්‍රව්‍යමය චලනයද අතර පවත්නා වෙනසයි. ගෙවුම් තුලනයෙහි (සේවා සහ සංක්‍රාමද ඇතුලත් වන) විදේශීය වෙළඳ අංශය වැදගත් වන තරමට ගෙවුම් තුලනයෙහි වෙනස්වීම් වලට ප්‍රධාන වශයෙන් හේතුවන්නේ විදේශීය වෙළඳ උපනතීන්ය.